

# පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

## මධ්‍යම පළාත

# *කාර්යය සාධන වාර්තාව 2017*



## "ගෙවන බද්ද මැද රටේ සංවර්ධනයටයි"


**පළාත් ආදායම්දෙපාර්තමේන්තුව**
අංක 244, කටුගස්තොට පාර, මහනුවර.

දු.ක. 0812213022
ෆැක්ස් : 0812213033
ඊමේල් :info@revenuedept.cp.gov.lk
cpcrevenue@gmail.com
වෙබ් අඩවිය : revenuedept.cp.gov.lk

## තත්ත්ව විශ්ලේෂණය

2011 වර්ෂයේ සිට දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ආදායම් ප්‍රභවය මුද්දර ගාස්තු ආදායම බවට පත් වන්නේ එතෙක් පැවති ප්‍රධානම ආදායම් ප්‍රභවය වූ පිරිවැටුම් බද්ද මධ්‍යම රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් අනුව 2011 අයවැය යෝජනා මගින් අත්හිටුවීමත් සමගයි. වර්තමානයේ පිරිවැටුම් බදු ලෙස 2010-12-31 දක්වා වන හිග හිටි බදු පමණක් අයකර ගැනීම සිදුවේ. ඊට අමතරව 2014-04-01 සිට ඔනිප අයිතීන් පිළිබඳ බද්ද ද, බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය 2015 නොවැම්බර් මාසයේ සිට ද ක්‍රියාත්මක වේ.මුද්දර ගාස්තු ආදායම සමස්ථ ආදායමෙන් 98 % ක් වන අතර, ඉතිරි ප්‍රමාණය අනෙකුත් ආදායම් ප්‍රභවයන්ගේ දායකත්වය යි.

වර්තමානයේ මධ්‍යම රජයේ බදු අය කිරිමේ ක්‍රමවේදය වඩාත් පුළුල් කර ඇති බැවින් සාමාන්‍ය මහජනතාව වෙත පීඩනයක් ඇති නොවන පරිදි, පළාතේ ආදායම් ඉහළ නංවා ගැනීම සඳහා නව ආදායම් ප්‍රභවයන් සොයා ගැනිමත් ඒවා අනුමත කර ක්‍රියාත්මක කිරීමත් ප්‍රබල අභියෝගයක්ව ඇත.

මධ්‍යම පළාත් සභාවේ ඵලදායිතාවය නංවාලීමේ අරමුණින් සකස් කෙරුණු 2017 - 2021 මධ්‍ය කාලීන සැලසුමට අනුව පළාතේ එක් දෙපාර්තමේන්තුවක් ලෙස පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ ද ක්‍රියාකාරි දායකත්වය සැපයීමේ අරමුණ පෙරදැරි කරගෙන එම උපායශීලි සැලසුමේම කොටසක් ලෙස අප දෙපාර්තමේන්තුවේ 2017 වර්ෂයට අදාල අරමුණු හා උපායයන් සකස් කෙරිණි.

## ආදායම් ඉලක්කය 2017 වර්ෂය

| ආදායම් ප්‍රභවය | | දෙපාර්තමේන්තු ඉලක්කය රුපියල් | පළාත් අයවැය දෙපාර්තමේන්තු ඉලක්කය රුපියල් |
|---|---|---|---|
| 01 | මුද්දර ගාස්තු | 1,585,000,000 | 1,585,000,000 |
| 02 | හිග පිරිවැටුම් බදු | 3,000,000 | *31,000,000 |
| 03 | ඔනිප අයිතීන් පිළිබඳ බද්ද | 3,500,000 | 3,500,000 |
| 04 | බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය<br>1. ඇප තැන්පතු<br>2. බලපත්‍ර ගාස්තු හා ලියාපදිංචි ගාස්තු | <br>500,000<br>5,000,000 | <br><br>1,400,000 |
| 05 | ඔට්ටු බද්ද | 100,000 | 100,000 |
| | එකතුව | 1,597,100,000 | 1,621,000,000 |

පළාත් අයවැය දෙපාර්තමේන්තු ඉලක්කය හා පළාත් ආදායම් දෙපාර්තමේන්තු ඉලක්කය යන දෙකම සැලකිල්ල ට ගෙන ඉලක්ක සකස් කරන ලදී. පිරිවැටුම් බදු පැනවීම අත්හිටුවා ඇති අතර අයකර ගැනීමට ඇති මුළු හිග පිරිවැටුම් බදු ප්‍රමාණයද රුපියල් මිලියන 33.9 පමණ වේ. මෙම ප්‍රමාණය තුළ ද නීතිපති උපදෙස් විමසා ඇති මුත් මෙතෙක් පිළිතුරු නොලද රු.මිලියන 5.4 ක් ද, ව්‍යාපාර හා පුද්ගලයින් නොමැති නිසා නිදහස් කිරීමට යෝජිත රු.මිලියන 9 ක් පමණ ද ඇත. එනිසා පිරිවැටුම් බදු සම්බන්ධයෙන් අයවැය දෙපාර්තමේන්තු ඉලක්කය ප්‍රායෝගික නොවේ.

# පළාත් ආදායම් දෙපාර්තමේන්තුව(මධ්‍යම පළාත)

**දැක්ම**

මධ්‍යම පළාතේ ආදායම් වර්ධනයට ඉහළම දායකත්වයක්

**මෙහෙවර**

ව්‍යවස්ථාපිත ආදායම් මූලාශ්‍ර තුලින් ආදායම් රැස්කිරීමත්, බදු හා ගාස්තු ගෙවිය යුතු පුද්ගලයන් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමත්, ඒ සම්බන්ධයෙන් විනිවිදභාවයෙන්, සමානාත්මතාවයෙන් හා සාධාරණව කටයුතු කිරීමෙන්, මධ්‍යම පළාතේ ආදායම වැඩි දියුණු කිරීම මගින් පළාත්වාසීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.

**වටිනාකම**

1. පරිපූර්ණාත්වය
2. වෘත්තීය දක්ෂකම
3. කැපවීම
4. සහයෝගීත්වය

**පරමාර්ථ**

1. ආදායම් ඉලක්ක සපුරා ගැනීම
2. නව ආදායම් උත්පාදන මූලාශ්‍ර පිළබඳ පර්යේෂණ හා සංවර්ධනය
3. වෘත්තීය නිපුණතාවය දියුණු කිරීම
4. තොරතුරු තාක්ෂණයේ සංවර්ධනය
5. තෙවන පාර්ශවයන් දැනුවත් කිරීම
6. යහපාලනය

## 2017 වර්ෂය තුළදී අරමුණු කරා ළඟාවීමේ ප්‍රගතිය

| ආදායම් ප්‍රභවය | | වාර්ෂික ආදායම් ඉලක්කය රුපියල් | 2017 වර්ෂය තත්‍ය ආදායම රුපියල් | ළඟා වීමේ ප්‍රගතිය |
|---|---|---|---|---|
| 01 | මුද්දර ගාස්තු | 1,585,000,000 | 1,680,273,887 | **106%** |
| 02 | හිග පිරිවැටුම් බදු | 3,000,000 | 2,966,157 | **99%** |
| 03 | ඛනිජ අයිතීන් පිළිබඳ බද්ද | 3,500,000 | 5,458,053 | **166%** |
| 04 | බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය<br>1. ඇප තැන්පතු<br>උකස්කරුගේ බැරට ඇති තැන්පතු<br>2. බලපත්‍ර ගාස්තු<br>3. ලියාපදිංචි ගාස්තු<br>අය කරන ලද දඩ | *500,000<br><br>5,000,000 | *2,500,000<br>*2,673<br>11,560,000<br><br>22,500 | **500%**<br><br>**231%** |
| 05 | ඔට්ටු බද්ද | 100,000 | **64,384 | **64%** |
| | එකතුව | 1,597,100,000 | 1,702,847,654 | **106.6%** |

(* බඩු උකස් ගන්නන් විසින් කරන ලද ඇප තැන්පතු, ආදායමක් ලෙස සැළකිය නොහැකි අතර එය වගකීමකි. ** යටතේ ඔට්ටු බද්ද යටතේ ආදායම වැඩි වීමට නම් පුද්ගලයින් අල්ලන ඔට්ටු ප්‍රමාණය වැඩි විය යුතුය. එය ප්‍රවර්ධනය කිරීම සඳහා පවතින නීති රාමුව තුළ දෙපාර්තමේන්තුවට කටයුතු කළ නොහැකි අතර, පුද්ගලයින් අල්ලන ඔට්ටු මත බදු අයකර ගැනීම සිදු වේ.)

### පරමාර්ථය 1: ආදායම් ඉලක්ක සපුරා ගැනීම

### 1.1 2017 වර්ෂයේ දී මුද්දර ගාස්තු ආදායම ලෙස රුපියල් මිලියන 1585 ක් එකතු කිරීම


වර්තමානයේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ආදායම් ප්‍රභවය මුද්දර ගාස්තු ආදායම වන බැවින් දෙපාර්තමේන්තුවේ වැඩ බෙදාහැරීමේදී මුද්දර අංශය වෙත වැඩි අවධානයක් යොමු කරන ලදි. ඒ අනුව වර්ෂයට අදාල ඉලක්කය වූ රු. 1,585,000,000 ඉක්මවා රුපියල් **ලක්ෂ 952** ක වර්ධනයක් කරා ළඟා කර ගනිමින් වර්ෂයේ ඉලක්ක ගත මුද්දර ආදායම **106 %** කරා ළඟා වීමට දෙපාර්තමේන්තුවට හැකි විය.

2017 වර්ෂය තුළ රැස්කරන ලද අතිරේක මුද්දර ගාස්තු ආදායම **82,928,606**/-කි. එකී මුදල රැස් කර ඇත්තේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ඍජු මැදිහත්වීමෙන් සහ දේපල පිහිටි ස්ථාන පරීක්ෂා කර, දෙපාර්තමේන්තුවට පුද්ගලයින් කැඳවා අවශ්‍ය අවස්ථාවන් හි තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු වාර්තා ද ලබා ගෙන සියළු තොරතුරු පරීක්ෂා කිරීමෙන් අනතුරුව කටයුතු කිරීම මගින් ය. මුද්දර ගාස්තු සඳහා ලබා දී ඇති ඉහළ ඉලක්කය ළඟා කර ගැනිමට හැකි වුයේ, නිලධාරීන්ගෙන් වැඩි ප්‍රමාණයක් මුද්දර ගාස්තු ගෙවීම් පරීක්ෂා කිරීම සඳහා යෙදවීමෙනි. ඊට අමතරව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලින් සියළු තොරතුරු ලබා ගෙන දේපල පිහිටි ස්ථාන පරීක්ෂා කිරීම වැඩි කිරීම, දේපලක් මිලදී ගැනීමේදී එහි නියම වෙළඳපොල වටිනාකම සඳහන් කිරීම මගින් අදාල දේපලට නියම වටිනාකමක් ලැබෙන බව නොතාරිස්වරුන් හරහා දේපල මිලදීගන්නන් දැනුවත් කිරීම, කාර්යය මණ්ඩලයේ ක්ෂේත්‍රයේ පලපුරුද්ද හා වෘත්තීය නිපුනතා වැඩිදියුණු කර ගැනීම මගින් නිවැරදි තක්සේරුකරණය හා වෙළඳපොල වටිනාකම මත සාධන පත්‍ර ලිවීමට පෙළඹවීම ද හේතු විය.

තවද නිශ්චල දේපලක් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කරන අවස්ථාවේ දී ම එම දේපලෙහි නියමිත වෙළඳපොළ වටිනාකම මත මුද්දර ගාස්තු අය කිරීමේ අරමුණ ඇතිව 2013 වර්ෂය් සිට ආරම්භ කරන ලද

වැඩ පිළිවෙළ මගින් ඔප්පුවක් ලියන පළමු අවස්ථාවේදී ම අදාල දේපල පිළිබඳ තොරතුරු අප දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, ඒවා පරීක්ෂා කිරීමෙන් අනතුරුව නියමිත වෙළඳපල වටිනාකම අනුව දේපල තක්සේරු කර, අප දෙපාර්තමේන්තුවේ මතය ලබා දීමට ක්‍රියා කිරීම තුළින් නියමිත මුද්දර ගාස්තුව මුල් අවස්ථාවේ දී ම අය කිරීමට හැකිවන නිසා පළාත් සභාවට වැඩි ආදායම් ප්‍රමාණයක් අප්‍රමාදව ලබා ගැනීමට ද හැකිවී තිබේ. මේ නිසාවෙන් ඌන මුද්දර ගාස්තු සඳහා තක්සේරු දැන්වීම් නිකුත් කිරීම අඩු වූ අතර, ප්‍රභවයේදීම නියමිත බද්ද අයකර ගැනීමට හැකි විය. 2017 වර්ෂයේ දී මෙසේ නිකුත් කරන ලද තක්සේරු වාර්තා ගණන 978 කි.

| මුද්දර ගාස්තු ආදායම | | | |
|---|---|---|---|
| වර්ෂය | ඉලක්කය | ආදායම රු. | වර්ධනය % |
| 2011 | **368,000,000** | **684,335,872** | 42% |
| 2012 | **725,000,000** | **827,681,905** | 21% |
| 2013 | 850,000,000 | 862,749,671 | 4% |
| 2014 | 875,000,000 | 1,072,465,077 | 24% |
| 2015 | 880,000,000 | 1,342,990,172 | 25% |
| 2016 | 1,188,000,000 | 1,642,042,811 | 22% |
| 2017 | 1,585,000,000 | 1,680,273,887 | 6% |




එමෙන්ම, වෙළඳපොළ වටිනාකම මත මුද්දරගාස්තු ගෙවීමේ අවශ්‍යතාව සම්බන්ධයෙන් නොතාරිස්වරුන් දැනුවත් කිරීම හා ඒ පිළිබඳව නිරන්තර අධීක්ෂණය නිසා නියමිත වටිනාකම මත මුද්දර ගාස්තු ගෙවීමේ යහපත් ප්‍රවනතාවයක් දිනෙන් දින වර්ධනය වෙමින් පවතී.

කෙසේ වුවද, මුද්දර ගාස්තු ආදායම් ශ්‍රිතයේ උපනතිය පරීක්ෂා කිරීමේදී පෙනී යන්නේ පළාත තුළ දේපළ පැවරීම් උපරිම (maturity stage) තත්වයට ළඟා වී ඇති බවයි.

### 1.2 පවතින හිඟ පිරිවැටුම් බදු වලින් රුපියල් මිලියන 3ක් එකතු කිරීම

මධ්‍යම රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් අනුව 2011 අයවැය යෝජනා මගින් පිරිවැටුම් බද්ද අත්හිටුවීම නිසා වර්තමානයේ පිරිවැටුම් බදු ලෙස 2010-12-31 දක්වා වන හිඟ හිටි බදු පමණක් අයකර ගැනීම කරන අතර පිරිවැටුම් බදු පැනවීමක් සිදු නොවේ.

ඒ අනුව 2017 වර්ෂයට ඉලක්කගත කළ හිඟ පිරිවැටුම් බදු ආදායම වන රු.3,000,000/- කි. වර්ෂය තුළ රුපියල් **2,966,157** ක් රැස් කරන ලද අතර, එය වාර්ෂික ඉලක්කය **99%** කින් ලගා කර ගැනීමකි. ඒ සඳහා නඩු පැවරීම් 33 ක් ද, දේපල තහනමට ගැනීමේ නිවේදන සමග ස්ථාන පරීක්ෂණ 93 ක් ද කිරීමට කටයුතු කර ඇත.

හිඟ පිරිවැටුම් බදු ශේෂය 2017-12-31 දින වන විට රු. 28,835,054/= ක් දක්වා අඩුකර ගැනීමට හැකිව ඇත. මෙම ප්‍රමාණයෙන් ගොනු 41 ක ට අදාලව ව්‍යාපාර හා පුද්ගලයින් නොමැති නිසා රු. 4,747,563/= ක මුදලක් අය කර ගැනීමට නොහැකි තත්වයේ පවතින බව ස්ථිරව හඳුනාගෙන ඇත.


ඉතිරි ගොනුවල කටයුතු කරගෙන යාමේදී හඳුනාගත් කරුණු වන්නේ

1. ව්‍යාපාර ආයතන නොමැති වීම
2. පුද්ගලයින් නොමැති වීම
3. සමහර ව්‍යාපාර ආයතන තිබුණද අදාල පුද්ගලයින් නොමැති වීම
4. පිරිවැටුම් බද්ද අත්හිටුවීමත් සමගම බදු ගෙවීමේ අනුකූලතාවය අඩු වීම යන ඒවා ය.

මෙම හේතු නිසා හිඟ පිරිවැටුම් බදු අයකර ගැනීම ඉතාමත් අසීරු කාර්යයක් වී ඇති අතර, අය කර ගැනීමට නොහැකි ප්‍රමාණය මීට වඩා ඉහළ යා හැක. දැඩි පරිශ්‍රමයක් දරා සොයා ගන්නා පුද්ගලයින්ගේ ද බදු ගෙවීමේ අනුකූලතාවය අඩු වීම නිසා නඩු පවරා අයකර ගැනීම සිදු කෙරේ. මෙසේ නඩු පවරන ලද සමහර පුද්ගලයින් අධිකරණය ද මගහරිමින් බදු ගෙවීමෙන් වැලකී සිටීමට උත්සාහ දරති.


### 1.3 බනිජ අයිතීන් පිළිබඳ බද්දරුපියල් මිලියන 3.5ක් එකතු කිරීම

2017 වර්ෂයට ඉලක්කගත බනිජ අයිතීන් පිළිබඳ බදු ආදායම වන රු.3,500,000/- වෙනුවට වර්ෂය තුළ රු. 5,458,053/- ක් රැස් කරන ලද අතර, එය වාර්ෂික ඉලක්කය **166%** කින් ළඟාකර ගැනීමකි. මෙම බද්ද ආදාල ව්‍යාපාර ක්ෂේත්‍රයේ යෙදී සිටින්නන්ට අළුත් බද්දක් වීම, පොදුවේ බදු සම්බන්ධව අඩු දැනුම හා බදු සම්බන්ධව ඇති ආකල්ප හේතුවෙන් මෙම ඉලක්කය ළඟා කර ගැනීම සඳහා වැඩි වශයෙන් ක්ෂේත්‍ර සමීක්ෂණ, ස්ථාන පරීක්ෂණ හා දැනුවත් කිරීමේ කටයුතු කිරීමට සිදු විය. වාර්තා නොසැපයීම මත නඩු පැවරීම් 57 ක් ද සිදු කරන ලදී.



### 1.4 බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය යටතේ ආදායම්

පළාත් අයවැය දෙපාර්තමේන්තුව ලබා දුන් **රු. ලක්ෂ 14** ක ඉලක්කය වෙනුවට පළාත් ආදායම් දෙපාර්තමේන්තු ඉලක්කය ලෙස 1. ඇප තැන්පතු රු. 500,000/- ක් හා 2. බලපත්‍ර ගාස්තු හා ලියාපදිංචි ගාස්තු රු. 5,000,000/- ක් ද ලෙස **රු.5,500,000** ක් ඉලක්ක කළ අතර, වර්ෂය තුළ ඇප තැන්පතු රු. 2,500,000/- ක්, බලපත්‍ර ගාස්තු රු. 3,860,000/- ක් හා ලියාපදිංචි ගාස්තු ලෙස රු. 7,700,000/- ක් ද අය කරන ලද දඩ රු. 22,500/- ක් ද උකස්කරුගේ බැරට ඇති තැන්පතු ලෙස රු. 2,673/- ක් ද ලෙස **රු. 14,085,173/-** ක් එකතු කර ඉලක්කය **256%** කින් ලඟාකර ගනිමින් වර්ෂයේ ඉලක්කගත ආදායම ඉක්මවීමට දෙපාර්තමේන්තුවට හැකි විය. 2016 හා 2017 වසරවලට අදාලව බලපත්‍ර ලබා ගැනීමේදී බඩු උකස් ගන්නන් සියලු දෙනා විසින්ම ඇප තැන්පතු තැන්පත් කර ඇති අතර, නව ව්‍යාපාරිකයන් සියලුදෙනා විසින් ඇප තැන්පතු වලට අමතරව ලියාපදිංචි ගාස්තු ද ගෙවා අවසන් ය. ඉදිරි කාලයේදී වාර්ෂික බලපත්‍ර ගාස්තු මේ යටතේ ප්‍රධාන ආදායම වනු ඇත.




**පරමාර්ථය 2. නව ආදායම් උත්පාදන ක්‍රම සොයා ගැනීම හා අනුමත කර ගැනීම.**

ඛනිජ අයිතීන් පිළිබඳ බද්ද 2014-04-01 සිට අයකිරීම සිදුවේ. බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය 2015 ඔක්තෝබර් මාසයේ දීසම්මත විය. පහත සඳහන් යෝජනා මේ වන විට ඉදිරිපත් කර ඇති අතර,මෙතෙක් අනුමත වී නොමැත.

1. ඖෂධ හා රසායන වෙළඳ බලපත්‍ර බදු ප්‍රඥප්තිය
2. මෝටර් රථවාහනයක අයිතිය පැවරීමේ මුද්දර ගාස්තුව
3. කාර්තුවක පිරිවැටුම රු.මිලියන 30 ට අඩු ව්‍යාපාර සඳහා පිරිවැටුම් බද්ද

**පරමාර්ථය 3: වෘත්තීය නිපුණතාවය දියුණු කිරීම**

- ආදායම් සේවයේ සියලුම නිලධාරීන් සඳහා දේපල කළමනාකරණය සම්බන්ධව දින දෙකක පුහුණු වැඩ සටහනක් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේදී පැවැත්වීම
- සමූපකාර සංවර්ධන පුහුණු ආයතනය මඟින් පවත්වන ලද පරිගනක වැඩසටහන් සැකසීම සම්බන්ධව පුහුණු පාඨමාලාවක් සඳහා නිලධාරීන් හත් දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සහභාගී කරවීම
- 2017 වර්ෂය තුළ දී පිරිස් හා පුහුණ අංශය මඟින් සංවිධානය කරනු ලබන පුහුණු වැඩමුළු සඳහා සේවා අවශ්‍යතා අනුව නිලධාරීන් සහභාගී කරවා ඇත.

**පරමාර්ථය 4: තොරතුරු තාක්‍ෂණයේ සංවර්ධනය**

- Web-based පරිගණක වැඩසටහනක් හා E-file Management System එකක් සෑදීම සඳහා කටයුතු අරඹා ඇත. 2018 වර්ෂය තුළ දී කටයුතු නිම කිරීමට අපේක්ෂිතයි.
- පරිගනක වැඩසටහන් සැකසීම සම්බන්ධව පුහුණු පාඨමාලාව හදෑරූ නිලධාරීන් කණ්ඩායමේ සහයෝගය ඇතිව ආයතනය තුළදීම ඉදිරි තොරතුරු තාක්‍ෂණ සංවර්ධන කටයුතු කිරීමට ද අපේක්ෂිතයි.

**පරමාර්ථය 5: තෙවන පාර්ශවයන් දැනුවත් කිරීම**

බදු හා ගාස්තු සම්බන්ධයෙන් තෙවන පාර්ශ්වය දැනුවත් කිරීමට හා ගෙවීමේ පහසුකම් වැඩි දියුණු කිරීමට වෙබ් අඩවියක් ආරම්භ කරන ලද අතර, එය යාවත්කාලීනව පවත්වාගෙන යයි.

ආකෘති පත්‍ර හා දැන්වීම් මඟින් බදු ගෙවන ජනතාව දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

**පරමාර්ථය 6: යහපාලනය**

- ඇගයීමට ලක් කල ආයතනයේ කාර්ය සාධනය
- රාජ්‍ය නීති හා රෙගුලාසි වලට අනුකූලව ක්‍රියාත්මක කරන ලද ආයතනයක්
- පැමිණිලිවලින් තොර වු ආදායම් දෙපාර්තමේන්තුවක් යන අරමුණු ළඟාකර ගැනීමට ආයතනය කටයුතු කර ඇත.

## 2017 ක්‍රියාකාරි සැලැස්ම සැලසුම අනුවකාර්ය සාධනය

| අරමුණ | අංශය | කාර්යයන් | ඉලක්කය | ළඟාවීම |
|---|---|---|---|---|
| 1. ආදායම් ඉලක්ක සපුරා ගැනීම | මුද්දර අංශය රු.මිලි.1585 | **ආදායම රු.මිලයන** | **1585** | **1680** |
| | | 1. ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වලින් සෘජුව ලැබෙන තොරතුරු අංශ අනුව බෙදාහැරීම<br>2. අදාල කාර්යාලවලට ගොස් තොරතුරු රැස්කිරීම<br>3. මෙම ලබාගත් තොරතුරු අදාල අංශ අනුව බෙදා හැරීම | 25000 | 26641 |
| | | 4. තොරතුරු ලේඛනයට අනුව ගොනු ආරම්භ කිරීම | 7000 | 7679 |
| | | 5. ගොනු සඳහා සාධන පත්‍ර කැඳවීම. | 7000 | 7679 |
| | | 6. ගොනු විශ්ලේෂණය කිරීම. (කටයුතු කළ ගොනු හා මත ගොනු) | 8000 | 8776 |
| | | 7. සාධන පත්‍ර නොලැබුණු ගොනු හඳුනා ගැනීම. | | |
| | | 8. i. ගෙවූ ගාස්තු ප්‍රමාණවත් නම් ගොනුව අවලංගු කිරීම. | | |
| | | ii. මතය ලබා දීමේදී සහ ගෙවීම් ප්‍රමාණාත්මක නොවන්නේ නම් සම්මුඛ සාකච්ඡා කැඳවා අතිරේක මුද්දර ගාස්තු තීරණය කිරීම හෝ එකතු නොවනවිට ස්ථාන පරීක්ෂණ සිදුකර හෝ අතිරේක මුද්දර ගාස්තු තීරණය කිරීම | රු.මිලි.80 | රු.මිලි. 82.93 |
| | | iii. දේපල තක්සේරු කිරීමේ කාර්යය සඳහා සිදුකිරීමට අපේක්ෂිත ස්ථාන පරීක්ෂණ සංඛ්‍යාව. | 1500 | 1313 |
| | | iv. සම්මුඛ සාකච්ඡා සඳහා කැඳවීම් ගොනු සංඛ්‍යාව | 6000 | 8318 |
| | | 9. තක්සේරු දැන්වීම් නිකුත් කිරීම සහ තක්සේරු සහතික (මත) නිකුත් කිරීම | 1700 | 1659 |
| | | 10. අභියාචනා /විරෝධතා විසඳීම.(ලැබෙන සියල්ල) | | |
| | | 11. තක්සේරු දැන්වීම මත ගෙවා නොමැති නම් නීතිමය පියවර ගැනීම | 25 | 11 |
| | | 12. තොරතුරු නොසැපයීම මත ගෙවා නොමැති නම් නීතිමය පියවර ගැනීම | 50 | 46 |
| | ඛනිජ අයිතීන් පිළිබඳ බදු අංශය රු.මිලි.3.5 | **ආදායම රු.මිලයන** | **3,5** | **5.4** |
| | | 1. ඛනිජ බදු වාර්තා නිකුත් කිරීම | 3000 | 4272 |
| | | 2. වාර්තා පරීක්ෂා කර ස්වතක්/නිදහස් ලකුණු කිරීම | 3000 | 681 |
| | | 3. ලිපිගොනු ආවේක්ෂණය කිරීම | 1500 | 1921 |
| | | 4. තක්සේරු දැන්වීම් හෝ අතිරේක තක්සේරු නිකුත් කිරීම | 50 | 36 |
| | | 5.ඛනිජ බදු ගෙවීම්පත් දත්ත පරිගණක ගත කිරීම | සියල්ලම | ඉටුකර ඇත |
| | | 6. වාර්තා නොසැපයීම මත ගෙවා නොමැති නම් නීතිමය පියවර ගැනීම | 50 | 21 |
| | බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය ගාස්තු හා තැන්පතු රු.මිලි. 5.5 | 1. ඇප තැන්පතු | රු.ලක්ෂ 5 | රු.මිලයන 2.5 |
| | | 2. වාර්ෂික බලපත්‍ර ගාස්තු | රු.මිලි. 5 | රු.මිලයන 11.5 |

| | | | | |
|---|---|---|---|---|
| | අය හා හිග බදු අංශය<br><br>හිග පිරිවැටුම් රු.මිලි. 3 | 1. අභියාචනා /විරෝධතා විසඳීම<br>ඉදිරිපත් කර ඇති සියලුම අභියාචනා විසඳා අවසන් කිරීම<br>2. පැහැර හැරි තැනැත්තන්ගේ ස්ථානවලට ගොස් හිග බදු/ ගාස්තු එකතු කිරීම (D 7)<br>3. නොගෙවූ හා එකඟතාවයකට නොපැමිණෙන අය වෙනුවෙන් නීතිමය පියවර ගැනීම.<br>4. ගෙවීම් පත්වල දත්ත පරිගණක ගත කිරීම<br>5. අගරු චෙක්පත් පිළිබඳව ප්‍රමාදයකින් තොරව කටයුතු කිරීම | සියල්ලම<br><br>250<br><br>50<br><br>සියල්ලම | ඉටුකර ඇත<br><br>93<br><br>33<br><br>ඉටුකර ඇත<br><br>ඉටුකර ඇත |
| 2. නව ආදායම් උත්පාදන ක්‍රම සොයා ගැනීම හා අනුමත කර ගැනීම. | | 1. නීති අධ්‍යයනය කිරීම හා පවතින ප්‍රභවයන් මොනවාදැයි අධ්‍යයනය කිරීම.<br>2. එම ප්‍රභවයන් පිළිබඳ සබ්‍යතා අධ්‍යයනයන් සිදු කිරීම.<br>3. එම එක් එක් ආදායම් ප්‍රභවයන්ගෙන් උපයාගත හැකි ආදායම හඳුනාගැනීම<br>4. ක්‍රියාත්මක කිරීමට වඩා සුදුසු ආදායම් ප්‍රභවයන් තීරණය කිරීම.<br>5. හඳුනාගත් නව ආදායම් උත්පාදන ක්‍රම යෝජනා අනුමැතිය සඳහා ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කිරීම | | යෝජනා 3ක් විට ඉදිරිපත් කර ඇත. |
| 3. කාර්ය මණ්ඩල පුහුණුව හා සංවර්ධනය | | 1. වෘත්තීය පුහුණු අවශ්‍යතා ක්ෂේත්‍රයන් හඳුනාගැනීම<br>2. පාඨමාලා ක්‍රමවේදයක් සකස් කිරීම.<br>3. සම්පත් දායක පුද්ගලයන් සහ ආයතන හඳුනාගැනීම.<br>4.පිරිවැය හඳුනාගැනීම. | | පාඨමාලා 2 ක් පවත්වා ඇත |
| 4. තොරතුරු තාක්‍ෂණයේ සංවර්ධනය | | 1. කාර්යක්‍ෂම, ආරක්‍ෂාකාරී තොරතුරු පද්ධතියක් සැකසීම<br>2. කාලීන අවශ්‍යතා අනුව යාවත්කාලීන කිරීම<br>3. Web Base පරිගණක වැඩසටහනක් සැකසීම | | ඉටුකර ඇත<br>ඉටුකර ඇත<br>කටයුතු අරඹා ඇත |
| 5. තෙවන පාර්ශ්වයන් දැනුවත් කිරීම | | 1. අදාළ ස්ථානවල ප්‍රදර්ශනය සඳහා දැන්වීම් සකස් කිරීම හා ප්‍රදර්ශනය කරවීමට සැලැස්වීම<br>2. පුවත්පත් දැන්වීම් එළ කිරීම<br>3. දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම<br>4. වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාම | | ඉටුකර ඇත |
| 6. යහපාලනය | | 1. ආයතනයේ කාර්යසාධන මට්ටම ඉහළ නැංවීම<br>2. රාජ්‍ය නීතිරීති හා රෙගුලාසි වලට අනුකූලව ක්‍රියාත්මක කිරීම<br>3. පැමිණිලිවලින් තොර වූ ආයතනයක් ඇති කිරීම | | ඵලදායිතා විශේෂ කුසලතා සම්මාන දිනා ගැනීම |

2017 වර්ෂය සඳහා ඉන්ධන වියදම් සඳහා වෙන් කිරීම් අඩු කිරීම නිසා ක්ෂේත්‍ර කටයුතු සීමා කිරීමට සිදු විය. එම නිසාවෙන් ස්ථාන පරීක්ෂණ ප්‍රමාණය සහ නඩු පැවරීම් ප්‍රමණය අඩු විය.

ඉහත සියලුම දත්තයන් ලබා ගන්නා ලද්දේ නිලධාරීන්ගේ දෛනික, මාසික, අර්ධ වාර්ෂික, වාර්ෂික ප්‍රගති වාර්තා සියල්ල පරීක්‍ෂා කිරීමෙනි.

**විශේෂ ජයග්‍රහණ**

2016 වර්ෂයේදී පැවති, 2015 වර්ෂය සඳහා වූ ඵලදායිතා තරඟාවලියේ දී පළාත් අංශයෙන් ඵලදායිතා විශේෂ කුසලතා සම්මානය දිනා ගැනීම අප දෙපාර්තමේන්තුව ලද විශේෂ ජයග්‍රහණයකි.

පාර්ලිමේන්තු රාජ්‍ය ගිණුම් කාරක සභාවේ දෙපාර්තමේන්තු 2015 කාර්යය සාධන ඇගයීම් වාර්තාව අනුව මූල්‍ය නීති හා කාර්යය සාධනය පිළිබඳ නියමයන් සඳහා අනුගතවීමේ ප්‍රතිශතය 89% ක් ලබා ඇත.( 2016 හා 2017 වර්ෂ සඳහා මෙම වාර්තාව මෙතෙක් නිකුත් කර නැත.)

තවද, අපගේ ප්‍රගතිය වර්ධනය කර ගැනීම සඳහා මහජනතාව, ව්‍යාපාරික ප්‍රජාව, ඉඩම් රේජිස්ටාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, රජයේ තක්සේරුදෙපාර්තමේන්තුව, මහජන බැංකුව, ලංකා බැංකුව හා පොලීසිය, අධිකරණ සහ වෙනත් රජයේ ආයතන මෙන්ම ගරු ආණ්ඩුකාරතුමිය ඇතුළු කාර්යය මණ්ඩලයෙන්,ගරු ප්‍රධාන අමාත්‍යතුමා සහ ප්‍රධාන ලේකම්තුමා ඇතළු කාර්ය මණ්ඩලයෙන් ලැබුණු සහයෝගයද කෘතඥතා පූර්වකව සඳහන් කර සිටිමි.

2017 වසරේ දී මෙන්ම 2018 වර්ෂයේ දී ද අපගේ ක්‍රියාකාරි සැලැස්ම තුළින් ඉදිරිපත් කරනු ලැබ ඇති ඉලක්ක අභිබවා යමින් මධ්‍යම පළාත් සභාවේ ආදායම් වර්ධනයට ඉහළම දායකත්වයක් ලබා දීමට අපි ඇප කැප වී සිටිමු.

**ස්තුතියි,**

(එච්. කේ. අජන්තා පෙරේරා)

පළාත් ආදායම් කොමසාරිස්

මධ්‍යම පළාත